# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2117/54 - 2019 අප්‍රේල් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2019.04.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* උදු 2/2/10/46.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය :* L/03J/95/FR/190.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශ්‍යතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවයේ විස්තර :*

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කරඹකැටිය ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි වින්චිහිල්ඩ්පාර්ක් වත්ත නම් වූ සර්වේයර් ජනරාල්ගේ අංක මහ 6866 දරන පිඹුරේ දැක්වෙන හෙක්ටයාර් 5.6772ක් වූ ඉඩම.

හිමිකම් කියන අය :

ඒ. වී. බී. අබේගුණසේකර - 3/බී/3, ඉහල වෙල, කෙන්ගල්ල
ඒ. ඩබ්. එම්. එම්. අබේගුණසේකර - 211/ඒ, අකරවිට, ගම්පහ
ඒ. වී. එස්. අබේගුණසේකර - 21, පරාක්‍රම සමුද්‍රය, පොළොන්නරුව
ඒ. වී. එච්. අබේගුණසේකර - අංක 169/6/ඒ,ගමමැද පාර, රද්දොළුව, සීදූව
ඒ. ඩබ්. ඩබ්. එල්. අබේගුණසේකර - 10ජී, වාගොල්ල පාර, ලේවැල්ල

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 මැයි මස 15 වැනි දින පෙ. ව. 11.00ට උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019 මැයි මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාවයන්ට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

සුජානී ආර්. විජේතුංග,
ප්‍රාදේශීය ලේකම්,
උඩදුම්බර.

2019 මාර්තු මස 27 වැනි දින,
උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-650

## ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* 9/3/1/1/6510053(1)126.

*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ*
*ලිපි ගොනු අංකය:* 4-3/4/2014/D-61.

ඉඩම් අත්කර ගැනීමෙ 7 වැනි වගන්තියට යටත්ව අංක 2060/11 හා 2018.02.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ අංක 3A පිටුවේ සඳහන් කඩඉම්, සිතියම් අංක 510053 (කලාප 1) හා පත්‍රය 4හි කැබලි අංක 126 මැනුම් සංශෝධනය පරිදි කඩඉම් සිතියම් අංක 510053 (කලාප 1) හා පත්‍රය 5 හි කැබලි අංක 135 සහ 136 ලෙස විභජනය වී ඇති අතර කැබලි අංක 126 ට අදාළ ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

**කැබලි අංක 135**

ඉඩමේ නම: කන්දබොඩවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; අවුරුදු 20ක් පමණ වයසැති තේක්ක ගස් 5ක් සහ හල්මිල්ල ගසක් ඇත; හිමිකම් කියන අය: එච්. ආර්. ආර්. එස්. විජේතුංග නීතිමය විධිවිධාන සහ මැනීමට හේතුව : ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීම සඳහා; ප්‍රමාණය : හෙක්ටයාර 0.2027

**කැබලි අංක 136**

ඉඩමේ නම: කන්දබොඩවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, අවුරුදු 20ක් පමණ වයසැති තේක්ක ගසක් ඇත; හිමිකම් කියන අය: එච්. ආර්. නිමල් ධර්මසිරි; නීතිමය විධිවිධාන සහ මැනීමට හේතුව: ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීම සඳහා; ප්‍රමාණය: හෙක්ටයාර 0.0241

යූ. ඩබ්. ටී. යූ රාජකරුණා,
ප්‍රාදේශීය ලේකම්,
දිවුලපිටිය කොට්ඨාසය.

2019 මාර්තු මස 29 වැනි දින,
දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-651

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.